# ජනකවියේ සමාජ සංස්කෘතික නිරූපණය පිළිබඳ අධ්‍යයනයක්

## (සමාජ සන්නිවේදනාත්මක විමර්ශනයකි)

*නන්දන මිල්ලගල*

### ප්‍රවේශය

"ජනකවිය" (Folk poetry) ජනශ්‍රැතියෙහි එන ප්‍රමුඛාංගයකි. එය අත්‍යවශයෙන්ම සමාජ නිර්මිතයකි. මෙහි "ජන" යන යෙදුම අරුත් ගැන්විය හැක්කේ එලෙසිනි. ජනයා විසින් නිර්මාණය කර, ව්‍යවහාර කරමින් පවත්වාගෙන එන කවියයි. "ජනයා" විවිධ පුද්ගලත්ව සාධක වෙතින් පැන නැගී, පොදු සමාජ ප්‍රවාහයක් බවට ප්‍රවර්ධනය වන්නකි. "කවිය" නම් වූ මාධ්‍ය පොදු ජන සමාජ ව්‍යවහාරයක් මෙන්ම ව්‍යාපාරයක් බවට පත් වීමෙන් "ජනකවිය" නම් සුවිශේෂී කලා ප්‍රභේදය නිර්මාණය වී ඇත. එහිදී පැන නගින ගැටලු වන්නේ ජනකවියට පරිබාහිර අනෙකුත් කවි මොනවාද? එවා ජනසම්භාවිත නොවන්නේ ද? යන්නයි. මෙහි කවිය, කාව්‍ය යන්නෙන් හඳුනාගත්තකි. කාව්‍ය වනාහි ගද්‍ය, පද්‍ය යනුවෙන් හඳුන්වන සාහිත්‍යාංගයෝ වෙති. එහෙත් මෙහි පද්‍ය කාව්‍ය යන ප්‍රභේදය "ජනකවි" යන්නෙහි එන "කවි" යන්නෙන් අදහස් වන බව පෙනේ. එය සිව්පද, සීපද මෙන්ම ජන ගී (Folk Songs) යනුවෙන් ද ව්‍යවහාරවේ.[1] එහෙත් කාව්‍ය යන සකු ව්‍යවහාරය "සාහිත්‍ය" යන්න වෙනුවට භාවිත කරන පුළුල්, සංකීර්ණ අරුත් දනවන්නකි. කවි යන්නෙන් පාණ්ඩිත්‍ය, විදග්ද බව යන්නද අදහස්වේ. ඒ අනුව ජනකවියට පරිබාහිරව පවත්නා කවිය, උගත්, වියත්, පණ්ඩිත සේවී සම්භාව්‍ය සම්මත වූවකි. එය පොදු ජන සමාජයට වඩා රජ, මැති, ඇමති හා උගත් වියත් සමාජ කොට්ඨාසයක් විසින් ඔවුනගේ අවශ්‍යතා සීමාවන් මත භාවිත කරන්නකි. අත්දැකීම්, භාෂාව, අලංකාර, වර්ණනා ආදිය එම සමාජ පංතිමය සාධකවලට සීමා වූවකි. එහෙත් එම කවි වුව ද ජන සමාජයට වින්දනය කළ හැකි වුවත්, පොදු ජන විඥානයෙන් දුරස් වූ ලක්ෂණවලින් යුක්තවන බව පෙනේ. ඇතැම් සම්භාව්‍ය කවීන් වුව ද පොදු ජනවිඥානයට සමීප වීමට උත්සුක වන්නේ තම නිර්මාණය ජන සමාජයේ පිළිගත්, ප්‍රචලිත කෘතියක් බවට පත්වීම පිණිස ය.[2]

"ජන" යනු ඉංග්‍රීසි People යන වචනයට සමාන බව සැබවි. එහෙත් mass යනු හුදෙක් "ජනයා" යන අර්ථයට සීමා නොවෙයි. ඒ විශාල සංඛ්‍යාවකින් යුත් ජනයාය. Mass Communication යනු විශාල සංඛ්‍යාවකින් යුත් ජන සමූහයකට අයත් සබඳතායකි. අනිත් අතට 1930 ගණන්වල දී පමණ "ජන" යන පදය ඉංග්‍රීසි folk යන සංකල්පයට පාරිභාෂික පදයක් ලෙස භාවිතයට පැමිණියේය.[3] සලකන්න ජනසම්මත කාව්‍ය, ජනකවි, ජනකතා, ජනවහර, ජනප්‍රවාද යන යෙදුම් 1967 වන විට ඉංග්‍රීසි folklore යන සංකල්පය සඳහා නියතවශයෙන් ජනශ්‍රැතිය යන පදය භාවිත වන්නට විය.[4] ඒ අනුව ජනකවිය පොදුජන සම්මත මාධ්‍යයක් ලෙස අධ්‍යයනය කළ හැකිය.

ජනකවියේ සමාජ සංස්කෘතික නිරූපණය යන තේමාව යටතේ සිදුවන මෙම විමර්ශනයේදී වඩාත් පුළුල් අධ්‍යයන පරාසයක් විවර වන බව ප්‍රකටවේ. එක් පසෙකින් ජනකවිය පොදුජන ව්‍යවහාරයකි. අනෙක් පසින් සමාජ සංස්කෘතියක අන්තර්ගතවන්නේ ජන ජීවිත ස්වරූපයයි. ජන සමාජ නිර්මිතයක්

1 අමරදාස වීරසිංහ, **සිංහල ජනශ්‍රැතිය හැදෑරීම**,(ගල්කිස්සඃ සංස්කෘති ප්‍රකාශන, 1986), 218 පිට.

2 එම., 116 - 117 පිටු .

3 නන්දසේන රත්නපාල, **ජනශ්‍රැති විද්‍යාව**, (කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 1995), 98 පිට.

4 එම., 98 පිට.

වන ජනකවිය නම් මාධ්‍යයෙහි ඇතුළත් වන්නේ එම සමාජ සංස්කෘතියේ රුව - ගුණය, හැඩතලය ජන ව්‍යවහාරයන්ය. මෙරට (ශ්‍රී ලාංකේය) ජන සමාජයේ ප්‍රචලිත ජන නිර්මාණාංගයක් වන ජන කවියේ,නිරූපණය වන සමාජ සංස්කෘතික භාවිතයන් විමර්ශනය කරමින් මෙම අධ්‍යයනය සිදුකෙරේ.

ජනකවිය නම් මාධ්‍ය හඳුනාගනිමින් එය මගින් දරා සිටින සමාජ සංස්කෘතික හරයන් විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයේ මුඛ්‍ය අරමුණයි. එහිදී සමාජයේ සහ සංස්කෘතියේ විවිධ භාවිතයන්, අගයන්, පිළිගැනීම් සහ සම්මුතීන් යනාදිය ජනකවිය නම් වූ සුවිශේෂ නිර්මාණශීලී මාධ්‍යයට ගෝචර වී ඇති ආකාරය පිළිබඳ විමර්ශනයට ලක් කළ හැකිය. එවන් අධ්‍යයනයන් වඩාත් සංකීර්ණ ලෙස උපයුක්ත වන්නේ,වර්තමාන හා අනාගත සමාජ දිශානතීන් හඳුනා ගැනීමටය. සමාජ මනෝවිද්‍යාත්මක ප්‍රවේශයකින්, ජනකවිය විමර්ශනය කිරීම ප්‍රචලිත ශික්ෂණවේදයක් වන අතර එය නව පර්යේෂණ විෂය කලාප මතුකර ගැනීමට ද හේතු වනු ඇත.

''ජනකවිය'' මුඛ පරම්පරාගත මාධ්‍යයක් ලෙස සාම්ප්‍රදායිකව පිළිගත්ත ද වර්තමානය වන විට විශාල වශයෙන් ජනශ්‍රැති ලිඛිතව හා මුද්‍රිතව ඒකරාශීකරණය වී ඇත. එබැවින් මුඛ්‍ය වශයෙන් ලිඛිත මූලාශ්‍රය පරිශීලනය අත්‍යවශ්‍යවේ. එසේම සමාජය විසින් ජනකවිය දරාගෙන සිටින ආකාරය නිරීක්ෂණය ක්‍රමය මෙන්ම සම්මුඛ සාකච්ඡා ආදිය භාවිත කරමින් විමර්ශනය කිරීමට සිදුවනු ඇත. විශේෂයෙන් අන්තර්ගත විචල්‍ය විශ්ලේෂණ ක්‍රමය මගින් ජනකාව්‍ය නිර්මාණවල අභ්‍යන්තරික අන්තර්ගතයන් හඳුනාගනිමින් ඒවා දත්ත ලෙස භාවිත කරමින් සමාජ සංස්කෘතික සාධක පිරික්සීමට සිදුවේ.

## විමර්ශනය

ශ්‍රී ලාංකේය සමාජය විවිධ සාහිත්‍ය නිර්මාණවලට අපූරු තෝතැන්නකි. එහි විකාසනය වසර දහස් ගණනක් ඈතට දිවෙයි. යම් සමාජයක දීර්ඝ කාලයක් මුළුල්ලේ ලිඛිත සාහිත්‍යයක් පැවතීම එම සමාජයේ දියුණුව පිළිබඳ නිර්ණායකයක් ද වේ. අප සාහිත්‍යයේ කැපී පෙනෙන ශාඛා දෙකකි. එනම් උගතුන් - වියතුන් විසින් සේවිත සම්භාව්‍ය සාහිත්‍ය සහ සාමාන්‍ය ජීනී ජනයා විසින් සම්භාවිත ජන සාහිත්‍යයයි. ජනකවිය, ජනසාහිත්‍ය පාර්ශවය නියෝජනය කරයි. සම්භාව්‍ය පද්‍ය කාව්‍ය නිර්මාණවල කර්තෘවරයෙක් හෝ කිහිපදෙනෙක් ප්‍රකට වුව ද ජනකාව්‍ය විෂයෙහි කර්තෘවරු වන්නේ ජනතාවය. එහි කර්තෘවරයෙක් නිශ්චිතව නොපෙනේ. එය ජනකවියේ එක් සුවිශේෂතාවකි.

යම් සමාජයක භාෂා භාවිතය දියුණු අදියරකට ප්‍රවිශ්ට වන කල එම සමාජයේ කාව්‍ය සාහිත්‍යාදී සෞන්දර්ය කලා මාධ්‍ය නිර්මාණයවේ. ඒ අනුව මෙරට දීර්ඝ කාලයක් පුරා ව්‍යවහාර වන කථිත හා ලිඛිත භාෂාවක් පැවතීම, මෙකී සම්භාව්‍ය හෝ ජන කාව්‍ය නිර්මාණය කෙරෙහි බලපා තිබේ. දෛනික සන්නිවේදනාත්මක හෝ ප්‍රකාශන අවශ්‍යතා එවන් භාෂාවක් මගින් සපුරා ගනී. එසේම තම ජීවන අත්දැකීම් සෞන්දර්යාත්මකව පරිකල්පනය කොට, භාෂාවේ අපූරු වාගාලාප ඔස්සේ ගලායාමට සැලැස්වීමෙන් කවිය ජනිතවේ. එය රසවාහිතය. අලංකාර ජනකය. ආස්වාදනීය වේ. ජනකවිය ද එසේමය. යම් සමාජයක මානව සම්පත සෞන්දර්යාත්මක වින්දනීය පිරිසක් වන කල එම සමාජයේ කවිය වැනි මාධ්‍යයන් උත්පාදනයවේ. මෙරට ජනකාව්‍ය විශාල ප්‍රමාණයක් නානා ප්‍රදේශවල විහිදී පැතිරී පවතින්නේ, මෙහි ජනයා වින්දනය, ආස්වාදය, ආනන්දය, චමත්කාරය ජීවන අභ්‍යාසයක් බවට පත් කරගත් ජන කොට්ඨාසයක් වන නිසාය.

''සිංහල සාහිත්‍යයේ - විශේෂයෙන්ම පද්‍ය කාව්‍යයේ පවතින ඇතැම් අඩු ලුහුඬුකම් පිරවීමට ජනකවිය සමත් වෙනවා. ඒ වගේම මෙරට ඌරුවෙන් යුත් සංගීතයක් බිහි කිරීම සඳහා සැලකිල්ල යොමු වුණු සංගීතඥයින්ටත් එය සරු බිමක් වෙනවා. මානව විද්‍යාව, සමාජ විද්‍යාව, සංස්කෘතිය ආදී විෂයයන් හදාරනවුන්ටත් ජනකවිය සැලකිය යුතු තොරතුරු සපයන ආකරයක්. මේ නිසා ශාස්ත්‍රඥයින්ගේ පමණක් නොවෙයි, සාමාන්‍ය උගතුන්ගේත් සැලකිල්ලට භාජනය විය යුත්තක් ජනකවිය''[5]

එබැවින් මෙරට සමාජ සංස්කෘතික තත්ත්ව නිරූපණ මාධ්‍යයක් ලෙස ජනකවිය එක් ප්‍රබල මාධ්‍යයකි. විධිමත් සම්බන්ධතා සහිත ජනරාශිකෘතිය මගින් සමාජ නිර්මාණයවේ. ඔවුනගේ ජීවන ඇවතුම් පැවතුම්වල ස්වභාවය මගින් සංස්කෘතිය ගොඩනැගෙයි. විධිමත් සම්බන්ධතාවලියකින් ජීවත්

5 ගුණවර්ධන නානායක්කාර, ජනකාව්‍ය සාහිත්‍ය සමීක්ෂා,( කැලණිය: කර්තෘ ප්‍රකාශන, 1998), 24 පිට.

වීම සමාජයක පුද්ගල පැවැත්මේ අනිවාර්ය සාධකයක්වේ. පුද්ගලයෙක් ඉපදී සමාජීය සත්ත්වයෙක් ලෙස කටයුතු කර මරණය දක්වා ගමන් කරයි. එයින් අවසන් නොවන ජීවිතය අනාදිමත් සාංසාරික ජීවිතයකට අවතීර්ණ වන බව ද පිළිගැනීමයි. එසේ උපතේ සිටම සමාජීය ජීවිතයේ විවිධ කටයුතු කිරීමේදී ජනකවිය ඒ සෑම අවස්ථාවකටම සම්බන්ධ වන බව ප්‍රකටවේ. සමාජයක පුද්ගලයා ප්‍රධාන ද්වාරකර්ම අවස්ථා හතරකට මුහුණ දෙන බව පැහැදිලිවේ. ''එනම් උපත, වැඩිවිය පැමිණීම, විවාහය හා මරණයයි''[6] පුද්ගල ජීවිතයේ එකී ප්‍රබල අවස්ථාවන් පදනම් කරගෙන ජනකවි නිර්මාණය වී ඇත. ඒ අනුව පුද්ගල හා සමාජ ජීවිතයට සම්බන්ධ වන ආකාරය අනුව ජනකාව්‍ය ක්ෂේත්‍ර කීපයක් ඔස්සේ ප්‍රභේදකරණයට ලක් කළ හැකිය.

1. පුද්ගල ජීවිතයේ ප්‍රධාන අවස්ථාවන් ලෙස ගැනෙන ද්වාරකර්ම.
2. ආගමික චර්යාවන් හා ඇදහිලි විශ්වාස.
3. කෘෂිකර්මාන්තය හා අනෙකුත් වෘත්තීයමය අවස්ථා.
4. උපදේශාත්මක හා අධ්‍යාපනික කටයුතු .
5. ප්‍රේමය, ආදරය හා විරහව වැනි මනෝභාව නිරූපණ.
6. විනෝදය, විශ්‍රාන්තිය හා ක්‍රීඩාව'
7. ඓතිහාසික සිදුවීම්, ප්‍රවාද, කතන්දර, සොබාදහම හා පාරිසරිය.යනාදී වශයෙනි.

ජනකවිය සමාජ, සංස්කෘතික නිරූපණ මාධ්‍යයක් ලෙස විමර්ශනය කිරීමේදී යථෝක්ත ක්ෂේත්‍රයන් පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත්වේ.

## පුද්ගල ජීවිතයට සම්බන්ධ ද්වාරකර්ම

සමාජ ජීවියෙක් වන පුද්ගලයා උපතේ සිට මරණය දක්වා පවත්නා ප්‍රධාන ද්වාරකර්ම අවස්ථා හතරකට මුහුණ දෙයි. එනම් උපත, වැඩිවිය පැමිණීම, විවාහ වීම සහ මරණය යනුයි. ''ජනකවි වැඩි හරියක් අපේ රටේ දක්නට ලැබෙන්නේ දරු නැළවිලිවලය. අද අපට ශේෂව ඇති මෙවන් දරු නැළවිලි කවි අනාදිමත් කාලයක සිට මුඛ පරම්පරාගතව පැවත එන කවි බවට සැක නැත.''[4] රිද්මයානුකූලව දරුවා සෙමෙන් නළවන අතරම මනස සමාධිගත වන්නේ කවියකිනි. එම කවි බොහෝ විට තමා අවට සමාජ පරිසරය පිළිබඳ චිත්‍රයක් කුඩා කල සිටම දරුවාගේ මනසේ නිර්මාණය කිරීමට සමත්වේ.

''දොයි දොයි දොයි දොයිය බබෝ
බයි බයි බයි බයිය බබෝ
නාඩා නැළවෙන්න බබෝ
තුන්සරණයි නුඹට බබෝ''

රිද්මය මෙන්ම ඒ යටින් දිවෙන සමාජ චින්තනයක් ද වේ. එය ''තුන්සරණයි නුඹට බබෝ'' යනුවෙන් ප්‍රකට කරයි. කුඩා කාලයේ සිටම දරුවාගේ මනසේ තෙරුවන් කෙරෙහි විශ්වාසය, ගෞරවය, භක්තිය ජනිත කිරීම අත්‍යාවශ්‍ය සමාජීය යුතුකමක් බැවිනි. එය සමාජානුයෝගී කාර්යභාරයක් ලෙස ද පෙන්වාදිය හැකිය.

වැදි ජනයා අතර ද මෙවැනි නැළවිලි ගී ගායනය සිදුවේ. ''වැදි ජනයා අතර භාවිත වන ගීතඅ අතරින් බොහෝමයක් නැළවිලි ගීය. වැදි කාන්තාවෝ දරුවන් නළවන විට නැළවිලි ගී ගයති.

''රෝ... රෝ... රෝ... රෝ...
චප්පිල එන්නා ඕ පැටුනේ
මානං ගාලේ චිරි බිරි ගානේ
මොරමල් සුවදේ බැරි අම්මේ
නාඩා පැටුනේ පුන්නන්නේ''

---

6 පියසේන කහඳගමගේ, ජනශ්‍රැතිය හා ජනතාව,( පන්හිඳ ප්‍රකාශන, බද්දේගම,2002), 99 - 100 පිටු.

කුරුල්ලන්ගේ හඬ අසා මොරමල් සුවඳ විඳගෙන නිදියන්නැයි කියන මේ වැදි ගීය මගින් පරිසරයේ අපූර්වත්වය ද නිරූපණයවේ. මෙයින් ගම්‍ය වන්නේ වාර්ගික විවිධත්වය, ප්‍රාදේශීය විවිධත්වය ආදිය පැවතියත්, උපන් දරුවාට සමාජ සංස්කෘතිය පැවරීමේ මූලාරම්භයක් ලෙස නැළවිලි ගී උපයෝගී වී ඇති බවයි. එසේම සමාජානුයෝජනයේදී අවශ්‍ය තමා ජීවත්වන වටපිටාව පිළිබඳ අවබෝධයක් ලබා දීම ද ජනකවි මගින් සිදුවී ඇත.

"ඔන්න බබෝ ඇතින්නියා
ගල් අරඹේ සිටින්නියා
ගලින් ගලට පනින්නියා
බබුට බයේ දුවන්නියා"[7]

මෙවැනි අවස්ථා මගින් ළමා පෞරුෂත්ව සංවර්ධනයෙහිලා වුව ද නැළවිලි ගීවල උපයෝගීතාව ප්‍රකට වේ. දරුවන් ලොකු මහත්වීමේ දී සමාජයේ ඥාති හිතමිතුරු ආදී විවිධ සම්බන්ධතා දැන හඳුනාගෙන කටයුතු කළයුතු බව වුව ද මෙම කවිවලින් ප්‍රකට කෙරේ.

"ඔන්න පුතේ ලොකු අයියා"
"එයි අම්මා විගසකිනේ"[8]
"පුංචි අම්මා සීදේවී"[9]
"පුතේ නුඹේ ලොකු අම්මා"[10]
"ලිපට පිඹින්නේ මද්දුම අක්කා"[11]

ළදරු සහ ළමා කාලය නැළවිලි ගී අසන කාලයයි. ඉන්පසු ප්‍රවිෂ්ට වන්නේ තරුණ අවධියට ය. වැඩිවියට පත්වීම ද්වාරකර්මයක් වන අතර එහි දී ජීවිතයට මුහුණ දිය යුතු ආකාරයත් ඇවතුම් පැවතුම් පිළිබඳවත් අවධානය යොමු වේ. යෞවන වියට එළඹීමත් සමඟ ශාරීරිකව හා මානසිකව සිදුවන වෙනස්කම් මෙන්ම, අවශ්‍යතාවන් පිළිබඳව ද සැලකිලිමත් වේ.

"අහස බලන්නේ සඳතරු දකින්න ද?
හොස්ස ලෙවන්නේ සාගිනි නසන්න ද?
රැවුල මදින්නේ නැකතට කපන්න ද?
කොයි දේසේ අඟණක් මෙහි ගෙනෙන්න ද?"[12]

පිරිමි ළමුන් සේම ගැහැණු ළමුන් වැඩිවියපත්වීම විශේෂ මංගල කටයුත්තක් සේ සැලකේ. "ඈත අතීතයේදී කොටහළු තොවිලය නම් (කෙටහළුයාගය) යාතු කර්මය තිබූ බව කියනු ලැබේ. කොටහළු තොවිලයට ඇතුළත් වූයේ මුඛපරම්පරාගතව රැකගෙන ආ කවි පංතිය, කොටහළුයාගය, ගිරිදේවී උපත ගිරිදේවී දළ කුමාර කවි, මල්වර මඟුල, මල්වර ශාන්තිය යන විවිධ නම්වලින් ව්‍යවහාරවන ජනකවි වැඩිවිය පැමිණීමේ යාතුකර්ම අවස්ථාවලදී විවිධාකාරයෙන් ප්‍රයෝජනයට ගනු ලැබේ."[13] වැඩිවිය පත් දරුවන් උදෙසා නොයෙක් සීමා බන්ධන මෙන්ම ඇවතුම් පැවතුම් නියමයන් පැවතුණි. ඒවා ඔවුනගේ ආරක්ෂාව ප්‍රමුඛ කොටගනිමින් නිර්මාණය වී ඇත. ඒවා උපදේශාත්මක කාව්‍ය ලෙස ද ව්‍යවහාර වන බව පෙනේ. කෑමබීම, ඇඳුම්, පැළඳුම් යායුතු නොයායුතු තැන් සහ වේලාවන් ආදිය වුව ද නියම කර ඇත. කිලි සහ තහංචි යන දෙපාර්ශවයට අදාළව ගැහැණු ළමයකු වැඩිවිය පැමිණීම සැලකිල්ලට ගනු ලබයි. "ගැහැණු ළමයකු වැඩිවිය පැමිණීම ගැහැණියක වශයෙන් ඇය කිල්ලට භාජනය වන මුල්ම අවස්ථාව නිසා මෙම අවස්ථාව ඇගේ අනාගත ජීවිතය කෙරෙහි මතුනොව සාමාජික වශයෙන් පවුලේ අනිකුත් අයට ද වැදගත් වන අවස්ථාවක් බැවින් මෙහි දී පැනවෙන තහංචි සාමාජික වශයෙන් වැදගත්

---

7 නන්දසේන රත්නපාල, **ජනශ්‍රැති විද්‍යාව** ,1995), 101 පිට.

8 ගුණවර්ධන නානායක්කාර, **ජනකාව්‍ය සාහිත්‍ය සමීක්ෂා**, (1998), 25 පිට.

9 ජයකොඩි හුරුළු වැව, **සිංහල ජනකවි**, (මීගමුව: අකුර ප්‍රකාශකයෝ), 14 පිට.

10 එම., 14 පිට.

11 එම., 14 පිට.

12 කමනී වින්ද්‍යා සෙනවිරත්න, **මඟුල් තහන්චි**, (කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2001), 15 පිට.

13 නන්දසේන රත්නපාල, **ජනශ්‍රැති විද්‍යාව** (1995), 101 පිට.

බවක් උසුලයි."[14] මල්වර මංගල්‍ය සම්බන්ධ තහංචි පැනවීමේදී කළු කුමාර දිෂ්ටිය සම්බන්ධව පවත්නා මතවාදය ප්‍රකටය. කිල්ලට අසුවී සිටින ඇය, රාත්‍රියේ තනි පංගලමේ හෝ පුළුටු ආහාරයට ගෙන ගමන් බිමන් යාම යෝග්‍ය නොවන බවත්, එසේ වුවහොත් කළු කුමාර යක්ෂයාගේ ඇල්ම බැල්ම එල්ල වී වියවුල් විපත් ඇති විය හැකි බවත් පිළිගනී.

"කොටහළු ගෙවලේ නිති ගැවසෙන්නේ
කිලි මල ලේ පිළි ලොබය කරන්නේ
කළු කුමරුනි තොප නැත බිලි වන්නේ
බුද්ධ අණත් තොප නාසා ඉන්නේ"[15]

එසේම වැදුම් කිල්ල වුවත් ස්ත්‍රීන් පමණක් මුහුණ දෙන කිලි දොස් අවස්ථාවකි. එම කිල්ලට අසු වූ අවස්ථාවේ වුව ද පැවතිය යුතු පිළිවෙල ජනකවිවල අන්තර්ගත වේ.

"වැදුම් කිල්ලෙ හැටි දන් නුඹ අහපන්නේ
ඉවූ බතුත් කිසි අයෙකුත් නොම කන්නේ
දේවාලෙට වෙහෙරට නොගොසින් ඉන්නේ
වැදූ ළඳගෙ කිලි මේ හැටි දන ගන්නේ"[16]

එහෙත් මගුල් හා මරණ කිල්ල ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයටම අදාළ වේ. එසේම විවාහය නමැති ද්වාරකර්මය සමාජීය ක්‍රියාවලියේ ප්‍රමුඛාවස්ථාවක් වේ. එය සමාජයක මූලික තැනුම් ඒකකය වන පවුල් සංස්ථාවක් ගොඩනැගීමේ අවස්ථාවයි. එය මෙරට චාරිත්‍ර වාරිත්‍රවල ඉතාම උසස් තැනකලා සලකන භාවිතාවකි. විවාහද්වාරකර්මය ආශ්‍රිත ජනකාව්‍ය නිර්මාණ බහුලව හමුවන්නේ මඟුල් තහංචි ආශ්‍රිතව ය. ගැමි තරුණියක් හා තරුණයෙක් අතර යම් කිසි ආදර සම්බන්ධතාවක් ඇති වුව ද එයට දෙමාපිය ආශිර්වාදය අපේක්ෂා කෙරේ. එය වර්ග සම්මුතියක් ලෙස හඳුන්වයි. "වරිග යනු කුලයයි. කුලයෙන් බැහැරව විවාහයක් සිදු කරන්නේ නම් එම තරුණයා හෝ තරුණිය වරිගයෙන් හෙවත් ඤාතිමිත්‍රාදීන් අතරින් පිටුවහල් වේ.

එම නිසා වරිග චාරිත්‍ර වාරිත්‍රවලට අනුගතව කටයුතු කිරීම සාම්ප්‍රදායික ගැමි සමාජයන්හි සුවිශේෂ ලක්ෂණයක් වූ බව කිවමනාය"[17]විවාහය සඳහා යෝජිත හෝ සහ සම්බන්ධකම් සහිත තරුණිය හා තරුණයා නෑනා සහ මස්සිනා වේ. තරුණයෙක් විවාහ කරගන්නේ නැන්දා-මාමා දෙදෙනෙකුගේ දියණියකි. එම තරුණයා බෑනා ලෙස හඳුන්වන අතර ඔහු නැන්දා-මාමාගේ ද හිත් දිනාගත යුතු වේ. එහිදී තම දියණිය රැක බලා ගැනීම, දරු මල්ලන් සෑදීම, ඔවුනගේ රැකවරණ සැලසීම, වතුපිටි හරකා බාන රැකබලා ගැනීම, ඔවුනගේ පරම්පරා සිරිත් ඉදිරියට පවත්වා ගෙනයාමේදී සමාජීය කාර්යභාරයන් සමූහයක් පැවරේ. මේ හා සමාන කාර්යභාරයන් සමූහයක් තරුණියට (බිරිදට) ද අදාළ වේ.

"කන්දෙ ගොසින් මම කැපුවේ තුඹ රූනා
ගෙදර ගෙනත් මම ඇඹරුව කර බානා
දොර කිතුලේ හැර බැන්දේ නොම සේමා
නැන්දේ නුඹට මංවද සුරතල් බෑනා"[18]

ආගමට දහමට අනුව පති දහමට මුල්තැන දෙමින් ඉටු කරන සමාජ සත් චාරිත්‍රයක් ලෙස විවාහය හැඳින්විය හැකි ය.

14 චන්ද්‍රසිරි පල්ලියගුරු, ජනශ්‍රැතිය, පුරාකතාව හා පුරාවෘත්තය (කොළඹ:, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2005), 86 පිට.

15 එම., 88 පිට.

16 එම., 88 පිට.

17 කමනී වින්ද්‍යා සෙනවිරත්න, මඟුල් තහංචි ( 2001), 18 පිට.

18 එම., 28 පිට.

"එදා පතිනි දෙවිඳුගෙ ඔංගල්ලෙට
බුලත් ගෙනාවේ නාග ලොවේ සිට
එදත් බෙදා දුන් බ්‍රහ්මණ දෙවිඳුට
අදත් බෙදා දෙන පළමුව උපතට"[19] යනුවෙනි.

එය ශ්‍රද්ධ සම්මත සමාජ චාරිත්‍රයක් බව මෙයින් ගම්‍යය වේ. විවාහයේ මුඛ්‍ය අපේක්ෂාවන් වන්නේ, එකිනෙකාගෙන් ආරක්ෂා රැකවරණය (Protection), පෝෂණය සලසාදීම (Nutrition) සහ වර්ගයා බෝ කිරීම (Reproduction) යන්නයි. මෙකී පරමාර්ථ සපුරා ගැනීමේ දී විවාහාපේක්ෂකයින්ගේ අන්‍යෝන්‍ය අවබෝධය හා විශ්වාසය අත්‍යවශ්‍ය වේ. එය ජනකවිවලින් ගම්‍යමාන වේ.

"දුර එනකොට වැටකෙයියා මලක් වගෙයි
ළඟ එනකොට රිදියෙන් කළ වැඩක් වගෙයි
ගෙට එනකොට ගෙයි ඇවිලෙන පාන වගෙයි
මගේ මැණිකේ මට මානෙල් මලක් වගෙයි"[20]

තම ජීවන වටපිටාවට සමීපස්ත උපමා අලංකාර ඇසුරින් තම සහකාරිය අගය කරන අතර එය ගැමි ජන ජීවිතයේ අන්‍යෝන්‍ය සහජීවනය නිරූපණය කරන්නකි.

"වනන්තරේ වන සපු මල් පිපීයන්
නිරන්තරේ නිල් වරලස මිදීයන්
පුංචි බඳට පෙති ගෝමර ඉසීයන්
ටිකිරි මැණිකෙ මට හීනෙන් පෙනීයන්"

"උඹනම් උදේ මට හිත ඇති කෙනෙක් වගෙයි"
"නුඹට එක්වෙලා මගෙ හිත යන්නාය"
"දුදුරු ඔයෙන් එන එතනගෙ ඔමරි බලාපන්"[21]

"මුතු මැණිකා හිටලා ගියකඩුල්ලේ
සීන් කෙන්දි මල් පුසුඔයි කඩුල්ලේ
ගෙනා දළු බුලත් ඉණවට මුළුල්ලේ
නිදිනම් සැපයි මුතු මැණිකෙගෙ තුරුල්ලේ"[22]

තම සහකාරියගේ රූසපුව සෞන්දර්යාත්මකව වින්දනය කරන ගැමියා, එයින් විවාහ ජීවිත සාර්ථක කර ගන්නේ ය. විවාහ ජීවිතයෙන් දරු මල්ලන් ලබා ජීවිතයේ අවසානයට එළබෙන ගැමියා මරණයට මුහුණ දෙන්නේ ඉතාම උපේක්ෂා සහගත සංයමයකිනි. මන්ද යත් ජීවිතයට මුහුණ දෙන විටත් සෑම විටම මරණය හෝ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රි ලක්ෂණ පිළිබඳ අවබෝධයක් තිබුණු බැවිනි. එයට හේතුව බෞද්ධ ආගමානුකූල ශික්ෂණයකින් ඔවුන් මෙහෙය වෙන නිසා ය. මිනිසෙක් මරණයට පත් වූ විට ගැමි ගෙවල වෙස්සන්තර ජාතක කාව්‍ය ගායනා කෙරිණි. "වෙස්සන්තර ජාතකය විවිධ විරිතින් බැදුණු පා ඇති, මරණයට පත් වූ අවස්ථාවකට විවරණය කිරීමට උචිත වූ භූමිකාවලින් සමන්විත ශෝකාන්විත කාව්‍යයකි. ඒ නිසාම ඒ කාව්‍යය මරණය සිදු වූ ශෝකදයක මොහොතේ මෙසේ ගායනා කරන්නට යෙදුණු යෙදුණු බව සිතිය හැකි ය."[23]

"නිතර ජරා මර සිහි කරපල්ලා
සතර අපා දුක් දුරු කරපල්ලා
අතර පතරවත් පව් නොකරල්ලා
පතර උතුම් තෙරුවන් වැඳපල්ලා"[24]

19 එම., 31 පිට.
20 **සිංහල ජනකවි සංග්‍රහය** (අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 2009), xiii පිට.
21 එම ., xviii – xx පිට.
22 පියසේන කහඳගමගේ ,**ජනශ්‍රැතිය හා ජනකාව**, (2002), 94 පිට.
23 නන්දසේන රත්නපාල, **ජනශ්‍රැති විද්‍යාව**, (1995), 103 පිට.
24 ස.ජ. සුමනසේකරබණ්ඩා, **පහළ ඌවේ ජනකවි**, (කොළඹ :1968), 13 පිට.

යන පිළි ගැනීම අනුව නිරන්තරයෙන් ජරා මරණය සිහිපත් කළ ගැමියා මරණය ද සාංසාරික ජීවන අත්‍යාසයක් කරගත් බැව් මෙයින් ප්‍රකට වේ.

"අත උස්සා වෙර වැයම් නැති දාට
ඇත්තක්මය එගැන මොනවට දුක් වීම
වළ ඉස්සා වැනි නියගක් දුටු දාට
නිල මැස්සා විතරයි පණ ගිය දාට

පොහොසත් දාට ඇඳ ඇතරිලි කොට්ට ඇති
දුප්පත් දාට ඉන්නට සෙවනකුත් නැති
ඇතිදා කන්න නැති නෑයෝ ගණන් නැති
මැරුණදාට පණුවෝ මිස කාත් නැති"[25]

මරණය සංසාරයට පිවිසෙන ද්වාරයක් වන අතර ඉන් පසු සාංසාරික ජීවිතය නිරා අපාදුක් නොවිඳ, සරා දිව්‍ය ලෝකවල තිබඳ, ජරා මරණ නැති නිර්වාණයට යාම ගැමියාගේ එකම අභිප්‍රාය විය. එය සරල ජීවන භාවිතයක් සේ පෙනුන ද ඉතාමත් ගැඹුරු දහමක්, චින්තනයක් නිරූපණය කරයි.

### ආගමික චර්යා සහ ඇදහිලි, විශ්වාස

ලාංකීය සමාජය විවිධ ආගමික චර්යාවලින් හා ඇදහිලි විශ්වාසාදියෙන් නොඅඩුය. බෞද්ධාගම ප්‍රමුඛ කොටගත් අනෙකුත් දේව, බ්‍රහ්මාදී ඇදහිලි මෙන්ම යක්‍ෂ, ප්‍රේතාදී, නීචභූතාදීන් ද පිදීම සිදුවේ. ජනකාව්‍ය නිර්මාණවල අනිවාර්යයෙන්ම එකී ආගමික ලක්‍ෂණ නිරූපණයවේ. මෙරට සම්භාව්‍ය පද්‍ය සාහිත්‍ය සම්පූර්ණයෙන්ම පාහේ බෞද්ධාගමික ශික්‍ෂණයකින් ගොඩනගා ඇති බව ප්‍රකට වේ. ජනකාව්‍ය නිර්මාණ ද යම්තාක් දුරට එම මග අනුගමනය කර ඇති බව පෙනේ.

"මේ සැරේ ඉතින් බැරිවෙයි දිනන්ට
මා කෙරේ වයිර සිතකුත් නොවන්නට
ආදරේ තමයි මේ පද අසන්නට
ආගමේ අකුරු තුන වග කියන්නට"

'ආ'යන්න ඇදීයම සිල් පද රකින්නට
'ග'යන්න ගැලවිල්ල සසරින් දිනන්නට
'ම'යන්න මාර්ගය දැන එතෙර වන්නට
අසන්න මේ අකුරු තුන වග කදීමට[26]

ආගම අවශ්‍ය වන්නේ කුමක් සඳහා ද යන්න පිළිබඳ ගැමි ජන විඥානය තුළ පැවතියා වූ අර්ථකථනය මෙයින් ගම්‍ය වන අතර-එය ඉතා සරල සංක්ෂිප්තාකාරයෙන් ඉදිරිපත් කිරීමට වග බලාගෙන ඇත. තේරවිලි, පදපෙරලි මෙන්ම දහම් ගැට විලාසයෙන් ජනයා සිය ධර්මාවබෝධය උරගා බැලීමට උත්සුක වී ඇත.

"පිටක තුන බුදුන්ගේ තෝරන් යාලූ"
"සූත්තර විනය, අභිධර්මය පිටක"[27]

බුද්ධාගමට අදාළ වෙනත්, ඇදහිලි පිළිබඳව ද ගැමි ජනයාගේ නොමද අවධානයක් පැවතී ඇත. එනම් ශ්‍රී පාදය දළදා වහන්සේ, ශ්‍රී මහා බෝධිය, ආදි බෞද්ධ සිද්ධස්ථාන මෙන්ම අටමස්ථානය, සොළොස්මස්ථානය ආදිය පිළිබඳව ද විවිධ ජනකාව්‍යයන් නිර්මාණය වී තිබේ.

25 ජයසෙනවි, හුරුළුවැව **සිංහල ජනකවි** 48 පිට.
26 එච්.යූ.පඤ්ඤාලෝක හිමි, **පුරාණ සිව්පද සංග්‍රහය** 222 පිට.
27 එම., 220 පිට.

"කන්ද උඩින් එන බුදු රැස් වළල්ලියේ
අඩ සඳ පටු නළල බැම සඟල දුල්ලියේ
කරේ තිබෙන මුතුලැල් සෙල්ලි සෙල්ලියේ
බූමිය ඉඩ ගන්ට බසු සුවර්ණ මාලියේ"[28]

සමනල ගිරි කුලට - වැඩලා මුනිඳු එම විට
තුඹු සිරි පතුලට - බැරවී දෙව් සුමන එතනට[29]

"අපිත් වඳිමු මුල්ගිරිගල විහාරේ"[30]
"කිරි ඇල්ලේගම පිපුණ තලමල සමනල සිරිපාදෙට නැමිලා"[31]
"ජයසිරිමා බෝසමිඳුන් පිරිමි පුතෙක් දෙන්ඩයි"[32]

දාගැබ්, මහබෝ හා ප්‍රතිමාදී වන්දනාව මෙරට සුලබ භාවිතයක් වන බැවින් ඒ ආශ්‍රිතව ජනකවි විශාල ප්‍රමාණයක් නිර්මාණය වී ඇත. එසේම ගොවිතැන් බත් ඇතුළු අන් සියලුම ජීවන කටයුතු ආශ්‍රිතව බුදුන්-දෙවියන් පිළිබඳ ගෞරවණීයත්වයක් සහිතව සිදු කර තිබේ. ඒ නිසා පුද පූජා වන්දනා ඇදහිලි අභිචාර සම්බන්ධ ජනකවි විශාල ප්‍රමාණයක් හමුවේ. තුන්සරණේ, වෙස්සන්තර ජාතක කාව්‍ය, යශෝධරාවත ආදී ලිඛිත ජනකවි සංග්‍රහයන් සම්පූර්ණයෙන්ම පාහේ ආගමික භක්තිය හා ශ්‍රද්ධාව ඇති කරවන කෘතීන් ය. ආගමික හරය හෙවත් ගැඹුරු චින්තාවක් අනාවරණය කෙරෙන කාව්‍ය නිර්මාණය කිරීම ලාංකීය ජනකවියා සතු සුවිශේෂ ලක්ෂණයක් ලෙස ද දැක්විය හැකිය.

බුද්ධ වන්දනාව, තෙරුවන් නමස්කාරය, ශ්‍රාවක ශ්‍රාවිකා, පුද පූජා ආදිය ප්‍රමුඛ වුවත් වෙනත් ඇදහිලි විශ්වාසාදිය පදනම් කරගත්, ක්‍රම රාශියක් ලාංකේය ජනයා සතුවේ.

"එතනින් පත්තිනි සඳ වඩිමින්නේ
ගොපලුන්ගේ වීදියට බසින්නේ"[33]

"සියනෑ කොරළෙ සියයක මැද්දේ
සැදුවයි පත්තිනි දේවාලේ"[34]

"ගෙනේ දකුණු අතට එරන් කලය දරනවා
අනේ නාථ දෙවියනි මල් අස්න වඩිනවා"[35]

"සත් අඩියට විනකළ යකු දොළ කැප ගෙන යොදන්නේ"[36]
"සෙල්ලම් සිරිපද මෙ අප රකිනවා
පුල්වන් දෙව් රජ වරම් ලැබෙනවා"[37]

ජනයාතුකර්ම, ශාන්තිකර්ම, බලිතොවිල් ආදියේදී විශාල වශයෙන් ජනකවි උපයුක්ත කරගනී. ශ්‍රී ලාංකේය සමාජය ගොඩනැගී ඇත්තේ ආගමානුකූල සංස්කෘතික පදනමක් මතය. සියලු භෞතික - අභෞතික සංස්කෘතික නිර්මාණාශ්‍රිතව එම ආගමික ආභාසය දැකිය හැකිය. මෙරට ප්‍රාදේශීයව ව්‍යාප්තව ඇති ලක්ෂ ගණනක් ජනකවි පරීක්ෂා කළහොත් ඒ සියල්ලෙහි පවත්නා ආගමික නැඹුරුව මනාව ප්‍රකට වනු ඇත.

---

28 **සිංහල ජනකවි සංග්‍රහය**, 48 පිට.
29 **පුරාණ සිව්පද සංග්‍රහය** 19 පිට.
30 පී. ඩී. එස්. ගන්දර වීරසූරිය, **ජනකවි සාහිත්‍ය**, 74 පිට.
31 චන්දන සමරවික්‍රම, **කුකුළු කෝරළේ ජනකවි හා ගැමි සංස්කෘතික ලක්ෂණ**, 78 පිට.
32 පීටර් විජේසිංහ, **ඌවේ ජනකවි**, 170 පිට.
33 **සිංහල ජනකවි සංග්‍රහය** 44 පිට.
34 එම.,32 පිට.
35 එම., 16 පිට.
36 එම., 17 පිට.
37 එම., 15 පිට.

## කෘෂිකර්මාන්තය හා අනෙකුත් වෘත්තීන්

ලාංකේය සමාජය කෘෂක සමාජයක් ලෙස පිළිගනී. ඒ සඳහා යෝග්‍ය පාරිසරික සාධකවලින් මෙරට වටපිටාව නිර්මාණය වී තිබීම සුවිශේෂිතය. එබැවින් ලාංකේය සංස්කෘතිය කෘෂිකර්මාන්තය පදනම් කරගෙන නිර්මාණය වී ඇත. ජනකාව්‍ය නිර්මාණවල ඒ සඳහා දැවැන්ත කලාපයක් වෙන්වී ඇත්තේ එබැවිනි.මෙරට කෘෂිකර්මාන්තයේ පැහැදිලි ප්‍රභේද දෙකක් දැකිය හැකිය.

1. වී වගාව ආශ්‍රිත කෘෂිකර්මාන්තය.
2. කටුසර වගාව හා අනෙකුත් භෝග වගාව වශයෙනි.

මෙහිදී වී වගාව ප්‍රධානවේ. එයට හේතුව ලාංකිකයාගේ ප්‍රධාන ආහාරය වන බත නිෂ්පාදනය වන්නේ ඒ ඇසුරෙන් වීමයි. ගොයම් කවි, නෙළුම් කවි, කමත් කවි, අඬහැර කවි, දැකැති වාරම්, මෙන්ම අලුත් සහල් මංගල්‍යය මෙන්ම ශාන්තිකර්ම ආශ්‍රිතව ජනකාව්‍ය නිර්මාණය වුව ද වී වගාව පදනම් කරගන්නා බව ප්‍රකටවේ. කුඹුර, වෙල, ලියද්ද ආදී වශයෙන් හඳුන්වන වී වගා භූමිය සකස් කර ගැනීම මූලික පියවරයි. දෙවියන් බුදුන් අදහමින් කුඹුරේ වැඩකටයුතු ආරම්භ කරයි. එය සාමූහික කටයුත්තක්වේ.

''අහසින් දෙවියෝ සෙවන කරන්ඩයි
පොළවේ මිහිකත බිම් බැඳගන්ඩයි
සතරවරම් දෙවි බලා සිටින්ඩයි
මේ වප් මගුලෙන් අප දිනන්ඩයි''[38]

මෙය එක්තරා අධිෂ්ටාන පූජාවක් ලෙස දියත් කර ඇත. ස්වභාවික විපත් ආදිය නොපැමිණ ගොවිතැන සරු කර ගැනීම ගොවියාගේ එකම අපේක්ෂාවයි. කුඹුරේ, වී ඉස පැලවීමෙන් පසු ගොයම් නෙළීම අරඹයි. එය බොහෝ විට කාන්තා පාර්ශවය විසින් සිදු කරනු ලබයි.

''කෙතට කෙතක් නැත මෙහෙම කෙතක් නැත
ගොයම් නෙළන මේ කෙත වාගේ''[39]

''කෙතට බසින්නට පළමුව වැඳගෙන සුරිඳුට
පිහිට රැගෙන මිස නොබසිනු අද මේ කුඹුරට''[40]

''බොළඳ ලියන් කර ඔසවා බලන බැලුම්
තැන්පත් රටාවයි දුම්බර කෙතේ නෙළුම්''[41]

ගොයම් පැසීම, බණ්ඩි ගොයම, කිරි වැදුණු ගොයම හෙළ ගැමියාගේ සතුට දනවන අවස්ථාවකි.

''ඇසී නාද හඬ බමරුගෙ ලීලා
පැසී ගොයම්පත් කරට නැමීලා
ගැසී සුළං වාතෙට ඉති නැමීලා
පැසී ගොයම් කෙත සුරපුර ලීලා''[42]

ගොයම පැසුණු කෙත සුරපුර හා සාමානය. පැසුණු ගොයම් කැපීම මීලඟ කාර්යයවේ. එය ද සාමූහික හැඟීමෙන්, මනා කළමනාකාරීත්වයකින් සිදු කළ යුත්තකි. ඒ සඳහා අවශ්‍ය කළමනා (උපකරණ, ආම්පන්න) යනාදිය සූදානම් කරගනී. දැකැත්ත එහිලා ඉතාම වැදගත් උපකරණයකි.

38 ජයකොඩි හුරුළුවැව, **සිංහල ජනකවි**, 24 පිට.
39 **සිංහල ජනකවි සංග්‍රහය**, 38 පිට.
40 එම., 3 පිට.
41 එම., 5 පිට.
42 එම., 6 පිට.

"රන්වන් දැකැති සුරතට අරගෙන රන්වන් ගොයමට ලඟා වෙතේ
අඩියෙන් අඩියට පේළි සැදීලා ගොයම් කපමු අපිදැකැත්තේ"[43]

එසේ කපන ලද ගොයම කමතට ගෙනඒමත් ඒවා ගොනුන් ලවා මඩවා වී ලබා ගැනීමත් ප්‍රමුඛ කටයුත්තකි. එය දෙවියන්, බුදුන්ගේ ආශිර්වාදය ලබාගෙන කරන ශුද්ධ කාර්යයක් ලෙස සලකයි.

"බුදුන් වඩිති මේ කමතට
සඳුන් සුවඳ විසිරෙයි වට
යොදුන් උසට තිබෙනා බැට
බුදුන් අණින් එන් කමතට"[44]

බැත ලබා ගැනීමත්, ඒවා වියලා සහල් සකසා පළමු කොටස නැවත බුද්ධ පූජාවට, දේව පූජාවට වෙන්කර අලුත් සහල් මංගල්‍යය, කොහොඹාකංකාරිය ආදිය පවත්වා ප්‍රයෝජනයට ගැනීම වී ගොවිතැන ආශ්‍රිත සංස්කෘතියයි. මේ සියලුම අවස්ථාවන් නියෝජනය කරන සිය දහස් ගණන් ජනකවි ඇත. එය මෙරට සමාජයේ අනිවාර්ය සංස්කෘතිකාංගයක් වේ.

වී ගොවිතැනට අමතරව විශේෂයෙන් වර්ෂාව තරමක් අඩු කාලවලදී කටුසර භෝග වගා කෙරේ. කුරක්කන්, මුං, කව්පි, තල, මෙනේරි, කොල්ලු ආදියත්, එසේම කැකිරි, පිපිඤ්ඤා, ලබු, පුහුල්, තම්පලා, මඤ්ඤොක්කා, බතල, ඉන්නල, දේසෙ අල ආදී අලවර්ග. වට්ටක්කා, වැටකොළු ආදියත් ඊට අයත්වේ. මෙරට බතල නොදෙවෙනි ආහාරයක් ලෙස කුරක්කන් වගාව ආශ්‍රිතව ද ජනකවි සංස්කෘතියක් පැවතීමෙන් එය මනාව ප්‍රකටවේ.

"මෙදා හේනේ පැහිලා ඇති කුරක්කන්
රන්වන් කරල් බරවී ඇති සුරුක්කන්
ඌරෝ නොකෑවොත් හේනේ කුරක්කන්
බඩගින්නට අවුසදයකි කුරක්කන්"[45]

මෙකී කෘෂිකාර්මික සංස්කෘතියේ අනන්‍යතාව විදහා දක්වන කැඩපතක් ලෙස ජනකවිය හඳුන්වාදිය හැකිය. එසේම ගොවිතැනට සිදුවන නොයෙකුත් අතුරු අන්තරාවන් සහ ඒවා වලකා ගැනීමේ ක්‍රමයක් ලෙස පැල් රැකීම සිදුවිය. එය රැය නිදිවරාගෙන සිදුකරන දුෂ්කර ක්‍රියාවකි. සතුන්ගෙන් සිදුවන හානි වළකාගනු ලැබුයේ ඔවුන් බියකර වනයට පලවා හැරීමෙනි. ඉඳහිට දඩයමට සතෙක් දඩයම් කළ ද එය වෘත්තියක් ලෙස දියුණු වූයේ නැත.

"ලස්සන හිමවතේ මාවී පැසෙන්නේ
දුක් දෙන අලි ඇතුන් පන්නා හරින්නේ
රැක්මෙන් දෙවියනේ වෙල බත් බුදින්නේ
දුප්පත්කම නිසයි මම පැල් රකින්නේ"[46]

කෘෂිකර්මාන්තයට අමතරව වෙනත් ජීවන වෘත්තීන් ගණනාවක් ලාංකිකයාට හුරුපුරුදුව තිබුණි. ඒවා කිසියම් ආකාරයකට ඍජුව හෝ වක්‍රව කෘෂිකර්මාන්තයට බද්ධව තිබුණි. කම්මල් වෘත්තිය, රන් රිදී කර්මාන්ත, වලං කර්මාන්ත, පතල් කැනීම, ඔරු පාරු පැදීම, ධීවර කර්මාන්තය, කරත්ත රස්සාව, පැදුරු විවීම, බඹර කැපීම, ආදී එදිනෙදා ජීවිතයට අවශ්‍ය බොහෝ දේ සම්පාදනය කර ගැනීමට අවශ්‍ය කර්මාන්ත සිදුකෙරුණි. ඒ වටා සංස්කෘතියක් නිර්මාණය වූ අතර ජනකවිවලින් ඒ ආශ්‍රිත ලක්ෂණ නිරූපණයවේ.

---

43 එම., 7 පිට.
44 එම., 9 පිට.
45 එම., 25 පිට.
46 එම., 23 පිට.

"ගොනෝ උඹට කළ පව් දැන් පළ දෙනවා
අනේ ගොනෝ ඇදපන් මීගමු යනවා" (කරත්ත කවි)[47]

"කොටියාකුඹුර ස්ටෝරුව බඩු කිරන
මාබෝගලේ පතලෙහි අපි වැඩ කරන" (පතල් කවි)[48]

"පූරුවේ කරපු අකුසල් ගෙවන්නට
පාරුවෙ ඇවිත් දුක් විඳිනවා දැනට" (පාරු කවි)[49]

"වලවේ මෝදර ද ඉසබාගල නොපෙනේ
වටගල බල බලා දුවන්න දියඹනේ" (ධීවර කවි)[50]

එකී වෘත්තීන්හි නිරතවන කල්හි පවත්නා වෙහෙස මහන්සිය මෙන්ම අවදානම ගැන පවා ගැමියා අවධානය යොමු කර ඇත. ඒ සියල්ලක්ම මැඩ ගනිමින් ජීවිතය ජයගත යුතුය යන අධිෂ්ඨානය ද ජනකවිවලින් නිරූපණයවේ. එම වෘත්තීන් හා බැඳුණු උපසංස්කෘතික ලක්‍ෂණ ජනකවිවලින් නිරූපණය වීම සැලකිලිමත් විය යුතු කලාපයකි.

## උපදේශාත්මක හා අධ්‍යාපනික කටයුතු

ජනකවිය පරපුරෙන් පරපුරට දැනුම සම්ප්‍රේෂණය කරන මාධ්‍යයක් වන අතර එක් පරපුරක් විසින් නිෂ්පාදනය කළ දැනුම ඊළඟ පරම්පරාව වෙත ගෙන ඒම එහිදී විශේෂයෙන් වැදගත්වේ. එසේම නව පරම්පරාවන් සමාජානුයෝජනය කිරීමේදී වර්තමානයේ මෙන් විධිමත් අධ්‍යාපන මධ්‍යස්ථාන නොතිබුණු බැවින් ඒ සඳහා පැරැන්නන්ගේ උපදෙස් හා මඟපෙන්වීම් බෙහෙවින් වැදගත් විය. අධ්‍යාපනය වුව ද විධිමත් පංතිකාමරගත සහතික අපේක්ෂිත අධ්‍යාපනයක් නොව දිවි පැවැත්ම සඳහා අධ්‍යාපනය යන මූලධර්ම කදිමට ක්‍රියාත්මක වී ඇත. උපදේශාත්මක හා අධ්‍යයන කාර්යයේදී

- ඇවතුම් පැවතුම් චර්යාවන් සමාජ සම්මුතික ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය මඟපෙන්වීම.
- චාරිත්‍ර, වාර්ත්‍රාදිය හඳුන්වාදීම.
- ආහාරපාන, ඇඳුම් පැළඳුම් ආදිය පිළිබඳ දැනුම්වත් කිරීම.
- බෙත් හේත් - ඖෂධ ආදිය සම්බන්ධ දැනුම පැවරීම.
- කෘෂිකාර්මික කටයුතු සඳහා උපදේශනය.
- උපත, මරණය හා විවාහය වැනි අවස්ථාවන් හා බැඳුණු දැනුම.
- පින් පව් - හොඳ නරක පිළිබඳ මගපෙන්වීම.
- ආචාරධර්ම හා නීති පිළිබඳ දැනුම ලබාදීම.

---

47 ජනකාව්‍ය සාහිත්‍ය සමීක්‍ෂා., 16, 18, 19, 21 පිට.

48 එම., 18 පිට.

49 එම., 19 පිට.

50 එම., 21 පිට.

ආදී ක්ෂේත්‍ර ගණනාවක් පුරා පැතිරුණු කාර්යභාරයකි.
''බුදුන් වඳින ලෙස වැඳපන් අම්මාට''[51]

''එළිය වෙන්ට පළමුව බැහැලා දොරට
පිරිය වෙන්ට අතුගාපන් ගෙදර වට
හීලට තිබෙන බත් දීපන් දරුවන්ට
රාළම් ටිකක් දීපන් වැඩකට යන්ට''[52]

"අඳුරු කරුවලේ පඳුරට මුවා වෙලා
වීදුලි එළිය දැක ගිනිහුල දියේ හෙලා
උනුනු ලියන් දැක තම ලියට තල තලා
දුවන මුවන් දැක නොදමන් නෙලූ පලා"

"කොතනද පාත එතනට දිය වෙයි රාසී
කොතනද මීය එතනට බිඟු වෙයි රාසී
කොතනද පාන එතනට පළගැටි රාසී
කොතනද කාසී එතැනටමයි හැම කාසී"

"වනක කුසුම් පිපුණත් රොන් විහිදෙන්ට
ඔදැක රොනින් පල නැත නිල මැස්සන්ට
කනක කොපුවලූවක් කල් පවතින්ට
සුනක නගුට බැරි ඇද හැරලා ගන්ට"[53]

මේ සියල්ල සමාජ සංස්කෘතික වටිනාකම් පිළිබඳ ගැමියාගේ පැවති අවධානය හා අවබෝධය පෙන්නුම් කරයි. යහපත් ජීවිත ගොඩනගා ගැනීමේ දී එකී උපදේශාත්මක මග පෙන්වීම් අනුව කටයුතු කිරීම අත්‍යවශ්‍ය වෙයි. එසේ නොවුණහොත් ඊට අදළව ද යම් යම් ක්‍රියා කාරකම් පවතී.

"මාරුව බලා සිත යටකැරකිල්ල
කාරිය කෙරෙනතුරු කාගෙත් රැවටිල්ල"
"නිල තල වැඩි වුණොත් මහතුන්ටයි වාසි
කුල මල නැති වෙනන් ඖෂධයකි කාසී"

"කනන්ට එපා පොලමින් සුදු හාල් හෙම
යන්නට එපා ගෙදරින් දොර නොවසාම"

"හවරි තුන හතර නොබඳින්න වරළට
ඔමරි කෙළි සිනා නොකියන් විහිලුවට
අපිරි වුණු දෙයක් නොබඳින්න කිසිවිට
මිහිරි වචන දෙන් හිමියන් රෝසවිට"

ඉතා සරල චර්යාවන් ලෙස පෙනුණ ද ඒ සියල්ල මනා සැලකිල්ලකින් සිදු නොකළ හොත් සමාජ ජීවිතයේ දී ගැටළු ඇතිවිය හැකිය. එබැවින් ජන කවියා ජනජීවිතවල සියුම් තැන් ගැන පවා සැලකිලිමත් බවින් උපදේශාත්මක මග පෙන්වීමක් සිදු කරන බව ප්‍රකට වේ.

51 ජනකාව්‍ය සාහිත්‍ය සමීක්ෂා 27 පිට.
52 එම., 28 පිට.
53 එම., 29 පිට.

### ප්‍රේමය ආදරය හා විරහව

මානව සමාජ සම්බන්ධතාවලදී මුඛ්‍ය වශයෙන් බලපාන චිත්තවේගීය සාධක ලෙස ප්‍රේමය සහ විරහව හැඳින්විය හැකි ය. බොහෝ මානව සම්බන්ධතාවල සාධනීය පාර්ශ්වය ප්‍රේමයෙන් නිරූපණය වේ. එහි ප්‍රතිවිරුද්ධ පාර්ශ්වය වන්නේ විරහව හෙවත් ප්‍රේමයේ නිශේධනාත්මක බවයි. විශේෂයෙන් සමාජයේ තරුණ-තරුණියන් අතර ඇතිවන ප්‍රේම සම්බන්ධතා අනෙකුත් සියලුම සබැඳියාවන් කෙරෙහි බලපායි. ප්‍රේමය ජීවිතයේ යහපත් ආශ්වාදනීය, සෞන්දර්යාත්මක සාධක නියෝජනය කරයි. එසේම ජීවිතය නිර්මාණශීලීව අවධිවන්නේ ආදරය, ප්‍රේමය හේතුවෙනි. එබැවින් ජනකවි ඇතුළු සියලුම නිර්මාණවලට මූලාශ්‍රයමය වස්තුබීජයක් ලෙස ආදරය ප්‍රේමය බලපායි.

ගැමි ජන ජීවිතයේ ප්‍රේමය හා විරහව තේමාකරගත් ජනකාව්‍ය නිර්මාණ ගණනාවක් හමු වේ. ඒ සියල්ලෙහි පවත්නා පොදු ගුණාකාරයන් අතර, උපේක්ෂා සහගත, ඉවසීමෙන් යුක්ත ශික්ෂණීය භාවයයි. ගැමි සමාජයේ ප්‍රේම සම්බන්ධතාවලට සම්බන්ධවන ස්ත්‍රී, පුරුෂ දෙදෙනා නෑනා සහ මස්සිනා ය.

"පානෙන් පාන් වනතුරු නිදි නොලබාමා
බානෙන් බැඳිලෙයට අපි දෙන්නාම ලමා
අත්හැර ඉන්න බැරි ළඳ නුඹ දුටුවාමා
හීනෙන් නුඹ ලඟයි ළඳ මම හැමදමා"[54]

"ළිඳටවත් ඇවිත් මා දකපන් ළමයා"
"අත්නාරිම් සෙනේ මගෙ පණ තිබෙන තුරු"[55]

"සාගතේ මොටද මිනිසෙක් සතෙක් නැති
ඕවතේ මොට ද ගමනට ඉඩක් නැති
සාමතේ මොටද මග පෙරලුමක් නැති
ජීවිතේ මොටද නෑනා කෙනෙක් නැති"[56]

"ලන්දුන් ගොඩ රුවයි හේනේ ඇල් නෙලනා
මන්දුක් විඳිම් ඇල් හේනේවේලෙමිනා"[57]

ගැමියාගේ ප්‍රේමය ඍජුය, අවංකය, තමාට හැඟෙන දැනෙන දේ වැඩි අලංකාරවලින් තොරව පවසයි. එම නිර්ව්‍යාජ ප්‍රේමය බිඳුණොත් එයින් නැගෙන විරහව විප්‍රලම්භ ශෘංගාරය ද අපූර්ව ලෙස නිරූපණය කරයි.

"වෙලේ ගොයම් සුළඟට නැමී නැමීයේ
පිලේ පැදුර වැස්සට තෙමී තෙමීයේ
නුඹේ සිතට මගෙ හිත නැමී නැමීයේ
තොටේ ළිඳට යනවද සුර කුමාරියේ"

"රන් කඳදෝ මිදුලේ කරකැවෙන්නේ
පන් කොලදෝ පිලපිට ඉඳ වියන්නේ
රන් මාලෙද කර වට ඔය දිලෙන්නේ
පින් මදිදෝ රන් මැණිකා නේන්නේ"[58]

තරුණ-තරුණියන් අතර ප්‍රේමය ප්‍රමුඛ ලෙස ජනකවිවල වස්තුබීජ වී ඇත. මීට අමතරව සමාජයේ අනෙකුත් සබඳතාවලට අදාළවන මව්පිය දූ දරු ආදරය, සොයුරියන් අතර ආදරය වැනි දෑ ද ජනකවියාට

54 ජනශ්‍රුති විද්‍යාව ., 109 පිට.
55 එම., 110 පිට.
56 පියසේන කහඳගමගේ, ජනශ්‍රුතිය හා ජනතාව, 158 පිට.
57 එම., 159 පිට.
58 ජනකාව්‍ය සාහිත්‍ය සමීක්ෂා, 30 පිට.

ගෝචර වී ඇත. විරහව රසයක් ලෙස වින්දනය කළ ද එය වෛරය පෝෂණය කිරීමට මාවතක් කර නොගත්තේ ය. එයට හේතුව සිදුහත්-යශෝධරා, සුදෙවුන්-මහාමායා, ගාමිණී-චිත්‍රා, සාලිය-අශෝක මාලා, කුස-පබා ආදී ඓතිහාසික පරමාදර්ශී ප්‍රේමවෘතාන්තවලින් ලද ආභාසය විය හැකි ය. එසේම ආදරය හා විරහව මත පදනම් වූ සංස්කෘතික සාධක ගණනාවක් ද ගොඩ නැගී තිබීම විශේෂිත ය.

## විනෝදය විශ්‍රාන්තිය හා ක්‍රීඩාව

මිනිසා විනෝදකාමීය. ක්‍රීඩාශීලීය. තම විවේකය, විශ්‍රාන්තිය ක්‍රීඩාශීලී ලෙසත්, විනෝදාත්මකවත් ගත කිරීමට දක්වන්නේ මහත් වූ අභිරුචියකි. ඒවා සමාජ සංස්කෘතිකාංග බවට පත්ව ඇත. සමාජ සාමූහිකත්වය, සහජීවනය වැනි පරමාර්ථ සාධනයට විනෝදය හා ක්‍රීඩාව බෙහෙවින් බලපායි. ජනකවිය තුළ සුවිසල් ප්‍රභේදයක් විනෝදය හා ක්‍රීඩාව වෙනුවෙන් වෙන්ව ඇත. බොහෝ විට ක්‍රීඩාවන්, කෙළි සෙල්ලම් මගින් විනෝදාත්මක පරමාර්ථ ලඟා කර ගැනීමට අපේක්ෂා කරන බව ප්‍රකටවේ. බොහෝ ජන නර්ථන, නාටක, යාතුකර්ම, ශාන්තිකර්ම, ඇදහිලි ආදිය සමඟ කාව්‍යමය නිර්මාණ යෙදෙන අතර ඒවා මගින් විනෝදය සාක්ෂාත් කරගන්නා අවස්ථා පවතී. සොකරි නම් ගැමි නාට්‍යවල එවැනි කාව්‍යාත්මක, විනෝදාත්මක ජවනිකා දැකිය හැකිය.

"සොකරි එන්නී සබයෙන් අවසර ගන්නී
නැටුම් නටන්නී තාලෙට රාග කියන්නී
පද අල්ලන්නී පියයුරු ළැම සොල්ලන්නී
කැඩපත ගන්නී සුරතින් කැඩපත ගන්නී"[59]

එසේම නාමල් නෙලීම, ඔළිඳ කෙළිය, මේවර කෙළිය, එළුවන් කෑම, රබන් ගැසීම, ඔන්චිලි පැදීම, කළගෙඩි සෙල්ලම, උඩැක්කි සෙල්ලම, පොල්කෙළිය, ලී කෙළිය, අං කෙළිය ආදී ක්‍රීඩා ආශ්‍රිතව ජනක්‍රීඩා රැසක් හමුවේ. ඒ සියල්ලක්ම පාහේ ජනකවි ඇසුරු කරගනිමින් නිර්මාණය වූ ඒවාය.

"වෙළබොඩ නා ගස දුරට පෙනෙන්නේ
ඒ ගස මුදුනේ කැකුළු පෙනෙන්නේ"[60](නාමල් නෙලීම)

"ඔළිඳ වැපුරුව ද බලකොයි නෑනෝ
එක් පෙතිවෙච්ච ද බලකොයි නෑනෝ" (ඔළිඳ කෙළිය)

"සාර සදිසි පෙති පේර නෙළන කල වලගියදෝ මං. මේවරයා
නෑනෝ නුඹ පල් නුඹෙ දරුවන්පල් අප දුටුවේ නැත මේවරයා" (මේවර කෙළිය)

"කුරුළු කුඩු කුඩු දුටින්
අපි දුටු කුඩුවක් නැතේ" (එළුවන් කෑම)

"තරිකිට දොං දොං අවුරුද්දයි
රබාන දූන් දූන් හරි ශබ්දයි" (රබන් ගැසීම)

"ඔන්චිලි චිලි චිල්ල මලේ
වැල්ලදිගට නෙල්ලි කැලේ" (ඔංචිලි වාරම)[61]

"සසිරි බැ මෙසිරිලක කඳ කුමරු සාමිනේ
දොළහ පත්තිනියනේ උමාගන දෙවියනේ" (අංකෙළිය)

---

59 ජනකවි සංග්‍රහය ,46 පිට.

60 ජනකවි, ( කෑගල්ලෑ සීවලී ප්‍රකාශන, 14 පිට.

61 ජයසෙනවි හුරුළුවැව, සිංහල ජනකවි . 15, 24 පිටු.

"එක පඳුරෙන් ලී සයක් කපාගෙk
එක උස ඇති සදෙනෙක් ගෙන්නාගෙන" (ලී කෙළිය)

"එරන් තැඹිලි පොල් අරගෙන සුරතට
වරන් ලැබුණි ගිනි පත්තිනි අපහට" (පොල් කෙළිය)

"සිරස ජටා මහ බඹු වරමින්නේ සිරස දරන්නේ
සවණවටා කුණ්ඩල දිලිසෙන්නේ දෙකන දරන්නේ" (උඩැක්කි සෙල්ලම)

"උදයට ඉරු දෙවියන් වැඳගල්ලා
පොලවට මිහිකත බිම වැඳපල්ලා"[62](කළගෙඩි සෙල්ලම)

යථෝක්ත ජනක්‍රීඩා ආශ්‍රිත ජනකවි මගින් ලාංකේය ගැමියා කායික වෙහෙස නිවාගනිමින් මානසික විවේකය හා විශ්‍රාන්තිය ඇතිකර ගැනීමට උත්සුකවී ඇත. එමගින් දූවැන්ත සංස්කෘතියක් නිර්මාණය වී ඇත. එසේම සමාජ සාමූහිකත්වය, සමාජ සංහිඳියාව, වැනි පරමාර්ථ සාධනයට ජන ක්‍රීඩාව මහත් පිටුවහලක් වී ඇති බව ප්‍රකටවේ. එමගින් ප්‍රබල සමාජ බන්ධනයක් තහවුරු වී ඇති බව ගම්‍යමානවේ.

## ඓතිහාසික සිදුවීම් ප්‍රවාද හා කතන්දර

ජනකාව්‍ය ක්ෂේත්‍රයේ මුඛ පරම්පරාගත අලිඛිත සම්ප්‍රදායක් මෙන්ම ලිඛිත සම්ප්‍රදායක් ද පවතී. ලාංකිකයා දීර්ඝ කාලයක් පුරා භාෂාවේ ද්වීරූප්‍යතාවම උපයෝගී කරගනිමින් ජනකාව්‍ය ව්‍යවහාර කිරීම විශේෂිතවේ. ඒ අනුව මෙරට සමාජ සංස්කෘතිය හා සම්බන්ධ ඓතිහාසික සිද්ධි, ස්ථාන, ප්‍රකට පුද්ගලයින් හා ඔවුනගේ විශේෂ ලක්ෂණ, දක්ෂතා ආදිය යක්ෂ, නාග, දේව, රාක්ෂස ආදී සිව්හෙළ ගෝත්‍රගත මානවයින් පිළිබඳ දේශීය හා විදේශීය වශයෙන් මෙරටට බලපා ඇති දෙවිවරුන් ආදීන් පිළිබඳ ජනකවි නිර්මාණය වී ඇත. විශේෂයෙන් ආගමික භාවිතයන් හා සම්බන්ධ වන බුදුන් වහන්සේ ඇතුළු අනෙකුත් ශාස්තෘවරුන් ද බුද්ධ ශ්‍රාවක ශ්‍රාවිකාවන් පිළිබඳව ද පවත්නා ප්‍රවාදගත කතා පදනම් කරගත් ජනකාව්‍ය රාශියක් නිර්මාණය වී ඇත. ඒ අනුව යශෝධරාවත, වෙස්සන්තර ජාතක කාව්‍ය, තුන්සරණේ, පත්තිනි හෑල්ල, ගණදෙවි හෑල්ල, වදන් කවි පොත, මුතු කුමාරිගේ කතාව, සින්නමුත්තු කතාව ආදිය මෙන්ම නුවර යුගයේ පමණ මෙරට ප්‍රචලිතව සිටි ගජමන් නෝනා, ඇලපාත මුදලි, අන්දරේ, හරණ ගණිතයා, කුංකුණාවේ හිමි ආදීන්ගේ කවි මෙන්ම ඔවුනගේ චරිත වටා ගොඩනැගී ඇති ප්‍රවාදාශ්‍රිත ජනකවි විශාල ප්‍රමාණයක් දකිය හැකිය. ඔවුනගේ ජීවිතවලට සම්බන්ධ රසවත් සිදුවීම් අපූර්වලෙස ප්‍රතිනිර්මාණය කර ඒවා සමාජ වත්කම් බවට පත්කර තිබීම වැදගත්වේ.

"වීදාගම හිමියන් ළමයෙක් මහණ කිරීම දෙමාපිය අවසරය ලබා ගැනීමට නිවසකට වැඩියහ. එහි රුවැති ළඳක් හාල් ගරමින් සිට තිබේ. උන්වහන්සේ ඇයගෙන් දෙමාපියන් පිළිබඳ තොරතුරු විමසුවේය. එය දුටු ළමයා දොර මුල්ලේ සිට කවියක් කීවේලු.

"සීන් සිනිඳු සිනිඳු ලොලේ
හීන් ඉඟට බැඳි සේලේ
හාල් ගරන කත මිදුලේ
එදැක සඟන ලොබය කළේ"

එම කව කී ළමයා නම් අන් කවරෙක්වත් නොව ෂඩ්භාෂා පරමේශ්වර තොටගමුවේ සිරි රාහුල හිමියන් බව කියවේ.[63] මේ ආකාරයට රජ, මැති, ඇමතිවරු, යතිවරු වැනි ප්‍රචලිත පුද්ගලයින් ගහකොළ, සතා සීපාවා ගැන පවා නොයෙකුත් ජනකතා, ජනප්‍රවාද ගොඩනැගී ඇති අතර ඒවා පදනම් කරගෙන ජනකවි ද නිර්මාණය වී ඇත. එය ඓතිහාසික සමාජ සංස්කෘතික සම්භාවයන් අධ්‍යයනය කිරීමේදී ද වර්තමාන පරම්පරාවන් වෙත දැනුමක් ලෙස ගෙන ඒමේදී ද වැදගත්වේ.

62 **ජනකවි**,(සීවලී ප්‍රකාශන), 25, 30 පිටු.

63 ඊ. ඇම්. රත්නපාල, **ජනජීවිතය**,( කොළඹ: ජනශ්‍රැතිය හා රයිගම, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 1991), 43 පිටු.

පාරිසරික සෞන්දර්ය හා සොබාදමේ චමත්කාරය පිළිබඳ ජනකවියා තරම් නිර්ව්‍යාජ වින්දනයක් ලැබූ අන් අය නැති තරම්ය. ඉර, හඳ, තරු, ගහකොළ, සතා සිව්පාවා, අව්ව, වැස්ස, සුළඟ, ගංගා ඇළදොළ මේ සියල්ල ඔහුගේ ජීවිතයේ අංගෝපාංගයන්ය. ඒවා තම ශරීරයේම කොටස් තරමට සමීප බවකින් සලකා ඇත. එයින් අප සමාජයේ පරිසර මිත්‍ර ප්‍රතිපත්තිය කදිමට අනාවරණය වේ. සොබාදහම දේවත්වයෙන් සැලකීම හුදු මිථ්‍යාවකට වඩා තිරසර සංකල්පයක් බව ප්‍රකට වේ.

## සමෝධානය

යථෝක්ත විමර්ශනයට අනුව ජනකවිය වූ කලී කිසියම් සමාජ සංස්කෘතියක වටපිටාවක හැදී වැඩෙන එක්තරා මාධ්‍යයක්වේ. ජනශ්‍රැති ප්‍රභේදයක් ලෙස සලකන ජනකවිය සමාජයේ සියලු සංස්ථා, ආයතන ස්පර්ශ කරයි. එය යම් සමාජයක පවත්නා සංස්කෘතික ආචාරධර්මවල, ඇගයීම් වටිනාකම්වල මෙන්ම සමාජ සම්මුතීන්වල එකතුවක් ලෙස සිතිය හැකිය. ජනකවිය ජනසංස්කෘතිය පිළිබිඹු කරන අතර එමගින් ජනහද ගැහෙන රාවය මනාව ධ්වනිතවේ. එසේම ජනකවිය ඥාණමය කෝෂ්ටාගාරයක් වන අතර, ජනවිඥානයේ සියුම් කම්පනයන් මනාව සනිටුහන් වී ඇත. ශ්‍රී ලාංකේය සමාජ සංස්කෘතික දේහයේ උච්චාවචනයන් හා අගයන් කලාත්මකව සංස්පර්ශ කළ මාධ්‍යක් ලෙස ජනකවිය හඳුන්වාදීම සාධාරණ විනිශ්චයකි.